ගී සඳලුව
Gee... Sandaluwa

සිසිර දිසානායක



# රෝහිත, කැමරන්, නාලක ඇගැයෙයි



පසුගියදා මෙල්බන් නුවර කෙරුණ අගනා කාර්යයක් පිළිබඳ මෙවර ගී සඳළුව මෙවර ලිපියේ ඉඩ වෙන්කර ගන්නේ එය ගීතයට සම්බන්ධ නිසා. උපා උපාදාස මහත්මාගේ සභාපතීත්වයෙන් යුත් වේවලී වැඩිහිටි සංගමය ඉටුකිරීමට යෙදුන යුතුකමක් පිළිබඳව සටහනක් තබන්නේ එකී උත්සවයට පෙර ඒ ගැන දැනුවත් කිරීමට නොහැකි වූ නිසයි. ඉතා චාම් අන්දමින් පැවැත්වීමට කටයුතු කළද අවසන උත්කර්ශවත් වූ මේ උත්සවය වූයේ දශක ගණනාවක් තිස්සේ අපගේ ගීතය වෙනුවෙන් නිහඬව, නොමිලේ, ගරු සේවයක් ලෙස ස්වේච්ඡාවෙන් සහාය වූ ශිල්පීන් තිදෙනෙකු ඇගයීමයි.

මව්බිමේ නිර්මාණය වූ ගී වෙනුවෙන් එරට ප්‍රවීණ ගායන ශිල්පීන්ට වාදනයෙන් සහය වූ, මෙරට අප ප්‍රජාවේ ගී හිතකාමීන්, ගායන හිතකාමීන් අතරින් බිහිවන නිර්මාණවලට තනු සහ සංගීත නිර්මාණයෙන් සහ වාදනයෙන්ද දායක වූ ශිල්පීන් තිදෙනකු මේ ඇගයීමට ලක් වුණා. දිගු කලක් තිස්සේ අත්වැල් බැඳගෙන එක්ව කටයුතු කරන මෙම ශිල්පීන් වූයේ කැමරන් කොළඹගේ, නාලක වීරකෝන් සහ රෝහිත උඩවෙල ශිල්පීන් තිදෙනායි.

සර පුවරුවට මෙන්ම ගිටාරයට සුහුරු වූ ඇඟිලි තුඩින් මෙන්ම සිය ගැඹුරු ගායනීය හඬින් රසිකයින් අමතන කැමරන් කොළඹගේ වාද්‍ය හා ගායන ශිල්පියා මධුර තනු හා සංගීතය නිර්මාණය කරනා සංගීතවේදියෙකුද වෙනවා. මෙවර විප්‍රවාසී අප ප්‍රජාවේ ගායන හිතකාමීන් වෙනුවෙන් තනු නිර්මාණය කළ කැමරන්, ආචාර්ය වික්ටර් රත්නායක, විශාරද අමරසිරි පීරිස්, කීර්ති පැස්කුවෙල්, මරියසේල් ගුණතිලක වැනි ප්‍රවීණයින් වෙනුවෙන් කළ නිර්මාණ වෙනුවෙන් ලැබෙන්නේ ඉහළ ප්‍රතිචාර. විශේෂයෙන්ම "ෆේස් බුක් " ප්‍රජා මාධ්‍ය ජාලයෙන්.

"ඉස්කෝලෙ යන කාලේ ඉඳන්ම මං ඔය සංගීත වැඩවලට ගියා. ස්කූල් කට් කරලත් ගියා කියලා මතකයි." කැමරන් ශබ්ද නගා හිනා වෙනවා. කැමරන්ගේ පාසල කොළඹ ශාන්ත පීතර විද්‍යාලය.

"අපි ඔය පල්ලියේ ගීතිකා එහෙමත් කිවුවා. වාදනය කළා. ඒ වගේම තාත්තගේ මියුසිකල් බැක්ග්‍රවුන්ඩ් එක අපට උපන්දා ඉඳන්ම ලැබුණ දෙයක්."



උපා උපදාස

අවිස්සාවේල්ල ප්‍රදේශයේ විසූ අර්ල්රඩ් කොළඹගේ මහත්මයා දක්ෂ වාදන ශිල්පියෙක්. පැට්‍රික් දෙණිපිටිය ප්‍රවීණයාගේ බටහිර පන්නයේ සංගීත කණ්ඩායමේ ක්‍රියාකාරීව සිටි අර්ල්රඩ් මහත්මාගෙනුයි කැමරන් දෙණිපිටිය ශිල්පියාණන් හඳුනා ගන්නේ. මීගමුවේ "ලා ලංකන්ස් " කැලිප්සෝ කණ්ඩායමට පාසැල් වියේදීම සම්බන්ධ වූ කැමරන් පසුව "ෂෙරින්ඩන් ඇන්ඩ් ද සන්ෂයි න් " කණ්ඩායමට කොළඹ "පයනියර්ස් " කණ්ඩායමටත් වෘත්තීය මට්ටමින් එක් වෙනවා. ඒ ගායනයෙන්, වාදනයෙන් දෙකන් ම 1976 ඉඳන්.

"1983 ජූලි කලබග කාලයේ මේ රස්සාව දිගටම කරගෙන යන්න බැරි වෙනවා. ඒ හින්ද මං තාත්තගේ වැඩවලට එකතු වුණා. රූපවාහිනියේ පස්වන සංවත්සරයට කරපු ප්‍රෝග්‍රෑම් එකක මම මුල් වතාවට පොෆෙෂනල් ආර්ටිස්ට්ලට බැක් කළා." කැමරන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වෙන්නේ 1987 දී. "අපි නිසන් කොම්පැණියෙ වැඩ කරන කාලේ රංජිත් වික්‍රමසිංහ මාවයි, තුසිතවයි පොඩි පොඩි වැඩවලට එක්ක යනවා. ඔහොම ගිහින් අපි පොලී, බන්දු, උපා, චින්තා වගේ අය අඳුනාගත්තා. ප්‍රභාතිගේ පොඩි පොඩි සන්දර්ශනවලට සම්බන්ධ වුණා. සිසිර - ඉන්ද්‍රාණි සෙ-නාරත්න ගායන ශිල්පීන්ගේ ප්‍රසංගයකට බැක් කරන්න අපිට අවස්ථාවක් ලැබුණෙ ඔය අතරෙදි. ඔය වෙලාවෙ තමයි තුසිත නාලකයි, රෝහිතයි ගැන කිව්වේ." කැමරන් අතීතය මතක් කළා. තුසිත කුළසේකර, නාලක වීරකෝන්, රෝහිත උඩවෙල මිතුරන් සමඟ කැමරන්ගේ සහය මෙල්බන් නුවර ප්‍රසංගවලට පැමිණි ප්‍රවීණයින්ට දිගින් දිගට ම ලැබුණා.

වසර 2004 දී මෙහි පැවැත් වුණ ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ "ස" ප්‍රසංගයට මෙහි වෙසෙන දරුවන් 15 දෙනෙකු ලවා ගීත දෙකකට සංගීතය සැපයීම කැමරන්ගේ මෙල්බන් මියැසි දිවියේ රන් ලකුණක්. උපා උපදාස, රෝහණ කරුණාරත්න සහ-ෘදයින්ගේ මේ අදහස ක්‍රියාත්මක කළේ කැමරන්. ඒ දරුවන් අතරින් දක්ෂතමයින් වුණු දිලිනි ප්‍රනාන්දු, නවීන් ගුලවිට, වීනා කෑදරගම දරුවනුත්, කලිඳු වීරසිංහ, මනෙ-ර්ජ්, රවී කුමාරසිංහ තරුණ පිරිසකුත් එක් කරගනිමින් කැමරන් කොළඹගේ නිර්මාණය කරගත් සංගීත කණ්ඩායමයි "තරංගා".

සුභාවිත ගී රස ඉස්මතු කරවන්නට දශකයකට වැඩි කාලයක් තරංගා මියැසිය වෙහෙසුනා. ඉන් අනතුරුව "රිප්ලේ 6" සහ රිඩෙන්ෂන් " බටහිර සංගීත කණ්ඩායම්වලට ගැයුමෙන් සහ වැයුමෙන් වෘත්තීය මට්ටමෙන් දායක වන කැමරන්, ඉන්ද්‍රජිත් මිරිහාන ප්‍රමුඛ වාද්‍ය වෘන්දයටත් වාදනයෙන් එක් වෙනවා.

අප අතර වෙසෙන නාලක වීරකෝන් සහ-ෘද්‍යා බටනලාව, සිතාරය මෙන්ම හාමෝනි යම් වාදනයෙන් හපන්කම් පානා තවත් ස්වේච්ඡා මියැසි සගයෙක් කුරුණෑගල ඉපිද මලියදේව විද්‍යාලයෙන් ඉගෙන ගන්නා අවදියේ සිටම සිතාරයක්, බටනලාවක් හුරුවීමට නාලකට අත්පොත තැබුවේ කේ.එම්. දයාපාල සංගීතාචාර්යවරයාණන්.

නාලක මේ රටට සංක්‍රමණය වුණේ 1989 දී. මෙහි සිටින ඉන්දියානු ජාතික අනු ශ්‍රී පින් සිතාර් වාදන ශිල්පිනියගෙන් සිතාරය වැඩි

24 වන පිටට

